**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව සමාගමට අයත් පිරිවැය රු.74,370,330 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් 2013 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් සිදුකර ඒවායේ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාල ප්‍රත්‍යාගණනය සිදුකර ඉදිරිපත් කරන්නෙමු. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම් වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික ක්ෂය ගණනය කිරීමේදී, එහි වත්කම් සම්බන්ධයෙන් අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු.3,926,147 ක් වූ ලීබඩු හා සවිකිරීම් අයිතම 251 ක් සහ පිරිවැය රු.6,749,618 ක් වූ කාර්යාල උපකරණ අයිතමයන් 90 ක ධාරණ අගයන් ශුන්‍ය අගයක් වී තිබුණි. එමෙන්ම උක්ත ප්‍රමිතියේ 79 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල නිවැරැදි අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී භාණ්ඩ නැවත ඇගයීමක් කර අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරන්නෙමු. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම් වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ යටතේ එකතුව රු.1,341,146 ක් හඳුනා නොගත් ශේෂ ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී අදාල ශේෂයන් පිළිබඳ සොයා බලා නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නෙමු. | මෙම ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලැබිය යුතු මුදල් ශේෂය රු.1,148,219 ක් ලෙස දක්වා තිබුණද , කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.1,858,502 ක් ලෙස දක්වා තිබීමෙන් රු.710,283 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් ලැබිය යුතු මුදල් ශේෂය පිළිබද දත්ත ඇතුලත් කරමින් අදාල මුදල් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරමින් මේ වන විටත් අදාල ලේඛණ ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනය අනුව නිවැරදිව සටහන් කර ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,797,439 ක් වූ විවිධ ණයහිමිශේෂ සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. වටිනාකම රු.477,630 ක් වූ ණයහිමියකුගේ ශේෂය පමණක් රු.307,900 ක් ලෙස තහවුරු කිරීම හේතුවෙන් එම ශේෂය අතර රු.169,730 ක වෙනසක් පැවතුණි | විගණනය විසින් ඉල්ලුම් කර තිබූ ශේෂ තහවුරු කිරීම් සඳහා අදාල ලිපි එම ආයතනයන් වෙත යොමු කරන ලදී. | ණය ශේෂයන්හි නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව රැකියා සඳහා විදේශ ගතවී සිටියදී මිය ගිය ශ්‍රමිකයන්ට ගෙවිය යුතු එකතුව රු.7,090,081 ක මරණ වන්දි ගෙවා නිදහස් කර නොතිබුණි. | මෙයට හේතුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නීත්‍යානුකූල වන්දි ලාභීන්ගේ නාම ලේඛණ ඉදිරිපත් කිරීමට තවමත් නොහැකි වීමයි. 2022 ජූලි මාසය වන විට අදාළ වන්දි ශේෂය රු.6,690,081 ක් දක්වා අඩු වී ඇත. | විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන් ලැබී ඇති මරණ වන්දි කාලීනව ගෙවා නිදහස් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 133 වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා නොතිබුණි. | මෙතෙක් වාර්ෂික මහසභා රැස්වීම් පවත්වා නොමැති අතර ආයතනයේ පූර්ණ කොටස් හිමිකාරීත්වය විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතු වේ. කිසිදු කොටස් හිමිකාරීත්වයක් බාහිර පාර්ශවයකට ලබා දී නොමැති බවත් දන්වා සිටිමි. | පනතෙහි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,326,918 ක පාඩුවක් වූ අතර වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.6,802,673 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,524,245 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.2,682,766 කින් අඩුවීමත් පුද්ගල වියදම් හා වෙනත් පරිපාලන වියදම් රු.5,837,425 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සමාගම වෙත ලබා දී තිබූ විදේශ ගමන් බලපත්‍ර 9 ක් 2019 වර්ෂයේ අස්ථානගත වී තිබුණු අතර සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිව යුත්තන් නිශ්චය කරගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විමර්ෂණ වාර්තාවක් පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සමාගම විසින් රු.20,000 ක දඩ මුදලක් ඇතුලත්ව රු.30,000 ක් වැයකර විදේශ ගමන් බලපත්‍ර 2 ක් සාදා දී තිබුණි. ඉතිරි ගමන් බලපත් සම්බන්ධයෙන් කිසිදු තීරණයක් මෙම වාර්තාවේ දිනය දක්වාම ගෙන නොතිබුණි. | ඉතිරි ගමන් බලපත්‍ර හිමි අය සඳහා ගමන් බලපත්‍ර සාදා ගැනීම සඳහා ඔවුන් හට දැනුම් දුන් අතර මේ වන තෙක් කිසිදු පුද්ගලයකු ඉදිරිපත් වී නොමැත. | ගමන් බලපත්‍ර වැරදි භාවිතය වැළැක්වීමට කඩිනම් පියවර ගතයුතුව තිබුණු අතර නොසැලකිළිමත්ව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් තොරතුරු තාක්ෂණ කටයුතු කළමනාකරණය කිරීම සඳහා 2014 වර්ෂයේ කළමනාකරුවකු බඳවාගෙන තිබුණද එම ක්ෂේත්‍රයේ නව්‍යතාවයක් සිදුවී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 0.3 ක් වැයකර ඒජන්සියේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට සැලසුම්කර තිබුණද එම කාර්යයද ඉටුකර නොතිබුණි. | ආයතනයේ මූල්‍යමය තත්ත්වය යහපත් තත්ත්වයක නොමැති වීම හේතුවෙන් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට නොහැකි විය. මූල්‍යමය තත්ත්වය යහපත් මට්ටමක පත් වූ විගස අදාල යාවත්කාලින කිරීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්යහෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානය ඉවත් කිරීමෙන් පසු සමාගමට රැගෙන ආ වායුසමීකරණ යන්ත්‍ර 06 ක් ඇතුලු භාණ්ඩ අයිතම විශාල ප්‍රමාණයක් අනාරක්ෂිත ලෙස සමාගමෙහි ගරාජයේ ගොඩගසා තිබූ අතර එම භාණ්ඩ ඒජන්සි පරිශ්‍රයේ පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා එසේ තබාගෙන ඇති බව පූර්ව වර්ෂයේ විගණන වාර්තා සඳහා පිළිතුරු ලෙස දන්වා තිබුණි. එහෙත් විගණන දිනය වූ 2022 ජුලි 14දින වන විටත් එම භාණ්ඩ කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන අනාරක්ෂිතව ගරාජයේ ගොඩගසා තිබුණි. | අදාල වායුසමීකරණ යන්ත්‍ර ආයතනයේ ඉහළ මාලයේ ගබඩා කාමරයේ ආරක්ෂිතව ගබඩා කර ඇති බව දන්වා සිටිමි. | මෙම උපකරණ ප්‍රයෝජනයට ගැනීම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව විධිමත් පරිදි සාමාන්‍යාධිකාරීවරයකු බඳවාගැනීමට දිගින් දිගටම කටයුතු කර නොතිබුණු අතර සමාගම ආරම්භයේ සිට 2021 වර්ෂය දක්වා වසර 26 ක කාලය තුල සාමාන්‍යාධිකාරීවරුන් 16 දෙනෙකු පත්කර තිබුණි. ඉන් වසරක කාලයක් සඳහා පමණක් ස්ථිර පදනමින් රේඛීය අමාත්‍යාංශය විසින් නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. 2000 වසරෙන් පසු අවස්ථා 11 කදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධාරීන් 09 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත විධිමත් ක්‍රමවේදයකින් තොරව එහි සාමාන්‍යාධිකාරී ලෙස සේවයේ යොදවා තිබුණු අතර සමාගමෙහි මූල්‍ය හා පරිපාලන අංශවල ඉහල තනතුරු සඳහාද කාර්යාංශ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත දිගින් දිගටම පත් කර තිබුණි. | එකී අදාල තනතුරු වලට බඳවා ගැනීමේදී ඒ සඳහා වැටුප් හා අනෙකුත් දීමනා ලබාදීම සඳහා ආයතනයේ මූල්‍ය මට්ටම ශක්තිමත් වී නොතිබීම හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලිත ආයතනයක් වන අප ආයතනය වෙත කාර්යාංශයෙන් ඒ සඳහා සුදුසුකම් හා පලපුරුදු ලත් නිලධාරීන් එහි ඉහල කළමනාකරීත්වය මගින් පත් කරන ලදී. | අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් ස්ථීර පදනමින් බඳවාගෙන සමාගමෙහි කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාරයේ චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2022 මැයි 24 දින දීය. | අදාල දින වන විට මූල්‍ය ප්‍රකාශන සකස්කරන ලද අතර රටේ පැවති කොවිඩ් උවදුර හේතුවෙන් අදාළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකිවීම හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ආයතන ලේකම් වෙතින් ලැබීමේදී කොවිඩ් රෝගයට ලක්වීම හේතුවෙන් අදාල ආයතනය තාවකාලිකව වසාතිබීම නිසා මෙම ප්‍රමාදය සිදු වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |